# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2194/25 - 2020 සැප්තැම්බර් මස 22 වැනි අඟහරුවාදා - 2020.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය : 13/97/FH/523.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය : ඉඅ/05/31.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 51 දෙඩන්දූව ග්‍රාම නිලධාරි වසමේ දෙඩන්දූව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක 3016 හා 2001.03.28 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 හා 02 මගින් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.3496 ක් වූ පරතොල්ල මෝදරවත්ත නැමැති පහත විස්තර කරන ඉඩම.

**කැබලි අංක 01 - ඉඩමේ නම: පරතොල්ල මෝදරවත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.3068**

මායිම් :

*උතුරට*: මුහුදු වෙරළ, දෙඩන්දූවේ ධර්මසේන ස්ථවිර හිමිකම් කියන පින්වත්ත සහ රේගුව පාර; නැගෙනහිරට: රේගුව පාර, කැබලි අංක 02, ඒ. එම්. ටී. අර්සකුලසූරිය හිමිකම් කියන පරතොල්ල මෝදරවත්ත; දකුණට: ඒ. එම්. ටී. අර්සකුලසූරිය හිමිකම් කියන පරතොල්ල මෝදරවත්ත සහ කේ. ජී. සුගතදස සහ තවත් අය හිමිකම් කියන ජන්තුංගවත්ත; බටහිරට: මුහුදු වෙරළ.

**කැබලි අංක 02 - ඉඩමේ නම: පරතොල්ල මෝදරවත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0428**

මායිම් :

*උතුරට*: කැබලි අංක 01 සහ රේගුව පාර; නැගෙනහිරට: රේගුව පාර; දකුණට: කැබලි අංක 01; බටහිරට: කැබලි අංක 01.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 ඔක්තෝබර් මස 28 වැනි දින ප.ව. 2.00 ට හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2020 ඔක්තෝබර් මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඒ. එම්. ඒ. යූ. ජී. කාරියවසම්,
ප්‍රාදේශීය ලේකම්,
හික්කඩුව.

2020 සැප්තැම්බර් මස 18 වැනි දින,
හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 280